INTERNATIONAL TRUTH AND JUSTICE PROJECT

**2020 මැයි 22**

W ITJPSL.COM
E ITJPSL@GMAIL.COM

EXECUTIVE DIRECTOR:
YASMIN SOOKA

**මාධ්‍ය නිවේදනය: සෝදිසියකින් තොරවම ශ්‍රී ලංකාවට අලුත් මේජර් ජෙනරාල් වරුන්**

**ජොහැන්නස්බර්ග්:** එක්සත් ජාතීන්ගේ 30/1 යෝජනාවේ දැක්වෙන ආරක්ෂක අංශ ප්‍රතිසංස්කරණ යටතේ ශ්‍රී ලංකාව විසින් පොරොන්දු වී ඇති පරිදි පූර්ව පරීක්ෂාවක් හා සෝදිසියක් මගින් නිලතල වලින් පහ කළ යුතු නිලධාරීන් ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ විසින් යුද්ධය අවසන් වීමේ එකොලොස් වැනි සංවත්සරයේදී හිතාමතාම මේජර් ජෙනරාල් තනතුරු වලට පත් කර තිබේ[1].

*"ඉතාම බරපතල දේශපාලනීකරණයක් වන මේ පුද්ගලයන් තෝරාගැනීමෙන් නැවතත් ශ්‍රී ලාංකිකයන්ටත් ජාත්‍යන්තර ප්‍රජාවටත් දෙනු ලබන පණිවිඩය වන්නේ වචනයට පමණක් සීමාවූ සංහිඳියාව පවා න්‍යාය පත්‍රයෙන් බැහැර කර ඇති බවයි. වින්දිතයන්ට කරන ලද තවත් එක් අපහාසයක් වන මේ ක්‍රියාවෙන් විලිබියෙන් තොර දණ්ඩ මුක්තියේ දුගඳ වහනය වෙයි,"* යනුවෙන් සත්‍යය හා යුක්තිය සඳහා වන ව්‍යාපෘතියේ (ITJP) විධායක අධ්‍යක්ෂිකා යැස්මින් සූකා පැවසුවාය.

වඩාත්ම කැපී පෙනෙන පත්වීම වන්නේ ශ්‍රී ලාංකික තානාපති නිලධාරියකුව සිටියදී මහජන සාමය කඩකිරීමේ වරදට මහා බ්‍රිතාන්‍ය අධිකරණයකින් වරදකරු කරනු ලැබූ ආඩිගේ ප්‍රියංක ඉඳුනිල් ප්‍රනාන්දු ගේ උසස්වීමයි. 2018 දී ශ්‍රී ලංකා මහ කොමසාරිස් කාර්යාල ගොඩනැගිල්ලෙන් පිටත උද්ඝෝෂණයේ යෙදුනු දෙමළ විරෝධතාකරුවන්ට ගෙල සිඳින සංඥාවකින් තර්ජනය කිරීම සම්බන්ධයෙන් ඔහු වරදකරු කරනු ලැබීය. ශ්‍රී ලංකාවට ගියදා සිට කිහිප වාරයක් උසස් වීම් දෙනු ලැබූ ඔහුගේ සාපරාධී ක්‍රියා නොතකා ඔහු පිළිගන්නා ලද්දේ වීරයකු ලෙසය.

*"හමුදා නිලධාරීන්ට මෙන්ම තානාපති නිලධාරීන්ටත් මෙයින් දෙනු ලබන පණිවිඩය නම් ලෝකය වටේ යමින් දෙමළ ඩයස්පෝරාවට අපහාස හා තර්ජන කළොත්, වරදාන ලැබෙන බව," යැයි යැස්මින් සූකා පැවසුවාය. "එය මහා බ්‍රිතාන්‍ය අධිකරණ පද්ධතියට කරන දරුණු අපහාසයක්ද වෙයි."*

වගවීමට එල්ල කර ඇති තවත් මරු පහරක් වන්නේ හිටපු විශේෂ බලකා ආඥාපති හරේන්ද්‍ර පරාක්‍රම රණසිංහගේ උසස්වීමයි. ඉසෙයිප්‍රියා යනුවෙන් ප්‍රකට දෙමළ රූපවාහිනී නිවේදිකාව අත් අඩංගුවට භාරගන්නා සෙබළකු ලෙස ඔහු වීඩියෝවකින් හඳුනා ගෙන තිබේ. ඇය පසුව හමුදා අත්අඩංගුවේදී මරා

---

[1] https://www.newsfirst.lk/2020/05/19/president-promotes-177-officers-of-the-sri-lanka-army-to-respective-next-rank/

**බ්‍රිගේඩියර් නිලයට උසස් කරන ලද අය මෙහි සඳහන් නොවේ. ඔවුන් මෙසේය:**

1. බ්‍රිගේඩියර් එස්.එන් සමරවික්‍රම
2. බ්‍රිගේඩියර් එච්.එම්.එන්.බී හේරත්
   ලුතිනන් කර්නල් එච්.එම්.එන්.බී හේරත් ශ්‍රීලංපාභ 31/05/2006, 04/10/2008.
   8සිංහ කර්නල් එච්.එම්.එන්.බී හේරත් 19.02.2010, 07.05.2012
3. බ්‍රිගේඩියර් එන්.ජී.එස් තිලකරත්න
4. **බ්‍රිගේඩියර් කේ.එන් පෙරේරා**

දමන ලද බව එක්සත් ජාතීන්ගේ විමර්ශනයකින් හෙළි කරගන්නා ලදී. ජය සංකේත ලෙස ගන්නා ලද ඡායාරූප වල පසුව අඩ නිරුවත් මල සිරුර දැක ගත හැකි ඉසෙයිප්‍රියා සමග ඉන්නා බව පැහැදිලිව දැකගත හැකි රණසිංහගෙන් අදවනතුරු සිදුවූ දේ ගැන ප්‍රශ්න කර නැත.

*"සිය දියණියගේ ඝාතනයේ සාක්ෂියක් මේජර් ජෙනරාල් පදවියකට උසස් කරනු ලැබීම පිටුවහලේ ජීවත් වන්නට බල කරනු ලැබ ජීවතුන් අතර ඉන්නා ඉසෙයිප්‍රියා ගේ පවුලේ උදවියට කෙලෙස බලපානු ඇතිදැයි අසන්නට සිදුවෙයි,'' යනුවෙන් යැස්මින් සූකා පැවසුවාය.*

වන්න ඩී විජේසූරිය යනු 512 බල සේනාව දෙමළ සැකකරුවන්ට අත්අඩංගුවේදී වධහිංසා පැමිණවූ බවට චෝදනා කෙරෙන සමයේ එහි යාපනයේ අණදෙන නිලධාරියායි. ඒ වධහිංසාවට ගොදුරු වූවන් කිහිපදෙනකුම සමග ITJP සම්මුඛ සාකච්ඡා පවත්වා තිබේ.

මේ උසස්වීම් කර ඇත්තේ හමුදාකරණය වැඩිවෙමින් පවතින සහ ජනාධිපතිට සමීප විශ්‍රාමික සහ රාජකාරියේ නිරත නිලධාරීන්ට සිවිල් රැකියා දෙනු ලබන පසුබිමකය. කෝවිඩ් 19 පිළිබඳ අවදානම තිබියදී සන්නද්ධ සේනා සම්බන්ධ යුද සමරුවක් මේ සතියේ කොළඹ පැවැත්වීමට අවසර දී තිබුනත්, උතුරු නැගෙනහිර එවන් අනුස්මරණ වැලැක්වීමට ආරක්ෂක අංශ විසින් වෛරසය හේතුවක් කරගෙන තිබුණි[2].

*''අප මේ අත්දකිමින් සිටින්නේ එදිනෙදා ජීවිතයේ හමුදා බලපෑම 'සාමාන්‍යකරණය' වෙමින් පැවතීමයි,'' යනුවෙන් යැස්මින් සූකා පැවසුවාය. ''ආකාරගත නොවන ජාල ජනාධිපති රාජපක්ෂ යටතේ විධිමත් කිරීමේ ප්‍රතිපලය වන්නේ දණ්ඩ මුක්තිය තවත් ගැඹුරට කිඳා බැසීමයි''.*

<u>මේජර් ජෙනරාල්වරුන් පස්දෙනා</u>

**1. මේජර් ජෙනරාල් ආඩිගේ ප්‍රියංක ඉඳුනිල් ප්‍රනාන්දු**

ගැමුණු හේවා බලකාය, සේවා අංකය: නි/60847.
2009 යුද්ධයෙන් පසු 2009 දී උසස් කරන ලදී[3].
2014: 511 බලකායේ ආඥාපති[4].
දෙමළ විරෝධතා කරුවන්ට එරෙහිව ගෙල සිඳීමේ සංඥාවක් කිරීමෙන් මහජන සාමය කඩකිරීම සම්බන්ධයෙන් බ්‍රිතාන්‍ය අධිකරණයකින් වරදකරු කරනු ලැබූ ඔහු එම තීන්දුවට විරුද්ධව අභියාචනය කර සිටී.
ඔහු 2009 දී යුද පෙරමුණේ ක්‍රියාකාරීව සටන් වැදුණු අයෙකි[5].
2009 යුද්ධයේදී තමන් බ්‍රිගේඩියර් ප්‍රනාන්දුට අණදුන් බව වර්තමාන ආරක්ෂක ලේකම් කමල් ගුණරත්න පවසා තිබේ[6]. ගෙල සිඳීමේ සංඥාව සම්බන්ධ මතභේදය පිළිබඳව හොඳාකාර දැනුවත්ව සිටියදී කමල් ගුණරත්න 2019 මාර්තුවේදී එම සංඥාව රූපවාහිනී කැමරා ඉදිරියේ නැවත අභිනයෙන් දක්වා බ්‍රිගේඩියර් ප්‍රනාන්දුට සිය සහාය පළකරමින් කියා සිටියේ සමස්ත සිද්ධියම ලේ කකියවන බවයි[7].

**2. මේජර් ජෙනරාල් හරේන්ද්‍ර පරාක්‍රම රණසිංහ**

විශේෂ බලකාය, සේවා අංකය: නි/60846.

---

[2] https://theleader.lk/news/3052-mullivaikkal-emotions-celebrated-over-quarantine-bans-video
[3] http://archives.dailynews.lk/2009/08/17/news28.asp
[4] https://reconciliationandrightssrilanka.wordpress.com/tag/houses/
[5] ITJP Dossier on API Fernando - https://itjpsl.com/assets/press/brigadier_api_fernando_final.pdf
[6] Translation: "This is an officer whom I know very well….he is an officer who used to work under me for a while. When I was serving as the commander of the air mobile brigade, one of its units was 5th Gemunu Watch. Priyanka Fernando was the second in command of that unit. At the time the air mobile brigade was stationed in Muhamalai. Muhamalai was the most dangerous place in Sri Lanka at the time. The air mobile brigade was there as an auxiliary force… Priyanka Fernando served as a major at the time."
<u>http://www.divaina.com/sunday/index.php/visheshanga1/2297-2018-02-09-13-22-12</u> - heading "This is blood boiling. It should not be mixed up with diplomacy. I would have done the same if I was there".
[7] Video 2'29"- 3'28" – throat slitting gesture - https://www.youtube.com/watch?time_continue=9&v=wB3sXNm-PDU&feature=emb_logo
You would all remember that officer making a frightful (mimes) gesture and leaving the place. A day after the incident the 'Divaina' newspaper editor – a classmate of mine, Mr Anura Solomons – called me and asked, "Kamal mate, what have you got to say about this?" My pat answer was, friends, "this is what you call blood boils". So, at that point, Anura Solomons said that he is sending his deputy editor to my home to get an interview about it. After that, the next Sunday there was a whole page of my analysis about it. So, friends, this is what blood boils really is. The best example for that is, the emotion you and I would have when the national flag is being trampled. 31 March 2019

යුද්ධයෙන් පසු 2009 දී උසස් කරන ලදී [8].
2009 දී 571 බලසේනාවේ අණදෙන නිලධාරී: 17 Dec. 2008 දෙසැම්බර් 17 - 2009 අගෝස්තු 6 (ජගත් ඩයස් සහ 57 සේනාංකය පිළිබඳ ITJP තොරතුරු ගොනුව බලන්න).

ප්‍රකට දෙමළ රූපවාහිනී නිවේදිකා සහ ගායිකා ඉසෙයිප්‍රියා නිරායුදව 2009 මැයි මාසයේ කලපුව අද්දරදී භාරවෙනු දැක්වෙන වීඩියෝවක් තිබේ. ඇගේ මළසිරුර දැක්වෙන ඡායාරූපද ප්‍රසිද්ධියට පත්වී තිබේ. 2015 දී එක්සත් ජාතීන්ගේ සංවිධානය විසින් පවත්වන ලද විමර්ශනයක නිගමනය වූනේ ශ්‍රී ලංකා යුද හමුදාවට භාර වීමෙන් පසු ඉසෙයිප්‍රියා ඝාතනය කරන ලද බවය. ඉසෙයිප්‍රියා අත්අඩංගුවට භාරගන්නා අය දැක්වෙන වීඩියෝවේ සිටින එක් අයකු ලෙස සාක්ෂි වාචකයකින්[9] විශේෂ කාර්ය බලකායේ ලුතිනන් කර්නල් හරේන්ද්‍ර රණසිංහ[10] හඳුනාගෙන තිබේ. ඇයගේ ඝාතනයට ඔහු වගකිව යුතු බවට ඇඟවීමක් නැතත්, ඊට වගකිව යුත්තේ කවුදැයි ඔහු දැන සිටීමට ඉඩ තිබේ.
පසුව ඔහු 2014-2015 සමයේ  වොෂින්ටනයේ ශ්‍රී ලංකා තානාපති කාර්යාලයේ ආරක්ෂක උපදේශක ලෙස පත්කර යැවිණි[11].

### 3. මේජර් ජෙනරාල් ඊ ජගත්[12] කොඩිතුවක්කු

ශ්‍රී ලංකා පාබල හමුදාව, සේවා අංකය නි/60845
යුද්ධයෙන් පසු 2009 දී උසස් කරන ලදී [13]
පිලිවෙලින් 58 සහ 57 සේනාංක යටතේ වන 581/571 බලසේනාව යටතේ 10 ශ්‍රීලංපාහ 2006 සැප්තැම්බර් 2-2008 නොවැම්බර් 30[14]
2008 මඩු දේවස්ථාන ප්‍රහාරයේ[15] සිටි අයෙකි. (ජගත් ඩයස් සහ 57 සේනාංකය පිළිබඳ ITJP තොරතුරු ගොනුව බලන්න)
2008 දෙසැම්බර් 8- 2010: ශ්‍රීලංපාහ මධ්‍යස්ථාන සේනා විධායක[16].
2017 – 512 බලසේනාවේ අණදෙන නිලධාරී[17].
2019: ආරක්ෂක අමාත්‍යාංශයේ හමුදා සම්බන්ධීකරණ නිලධාරී[18].
2019: 66 වැනි පාබල සේනාංකයේ සේනාංකාධිපති[19].
2019: ජිනීවාහි පොකුරු වෙඩි සමුළුවේ ශ්‍රී ලංකා නියෝජනය - යුද්ධයේ පොකුරු බෝම්බ ප්‍රහාරයට ගොදුරුවූවන් නැතැයි ශ්‍රී ලංකාව ප්‍රකාශ කළේ මෙහිදීය. ජීවිත බේරාගත්තවුන් විසින් ඊට විරුද්ධව කරුණු දක්වා තිබේ (ITJP) වාර්තාව බලන්න[20].

### 4. මේජර් ජෙනරාල් චන්න ඩී වීරසූරිය[21]

ශ්‍රී ලංකා පාබල හමුදාව, සේවා අංකය නි/60877
උපන් දිනය: 1968 ජුලි 15
2007 පෙබරවාරි 15-2008 දෙසැම්බර් 12: 4 ශ්‍රීලංපාහ[22] (631 බලසේනාව
2009 දී ශ්‍රීලංපාහ සටන් පෙරමුණේ සිටි බලසේනාවකි[23].

---

[8] http://archives.dailynews.lk/2009/08/17/news28.asp
[9] ITJP Dossier on Kamal Gunaratne, https://itjpsl.com/assets/press/Kamal-Gunaratne-dossier-final-optimized.pdf Page 37.
[10] https://www.youtube.com/watch?v=RUB6n6icWd4 and on file.
[11] https://2009-2017.state.gov/documents/organization/227828.pdf
[12] It was on September 06, 2007 that Lt. Colonel Senerath Bandara, who was the Colonel GS of the 57 Division, took over the command of the 572 Brigade which was heading towards the Thampanai village along the Madhu road.
The Brigade comprised 10 SLLI under Lt. Colonel Jagath Kodithuwakku, 7 SLLI under Lt. Colonel Ranjith Abeyratne and 7 SR under the command of Lt. Colonel. Palitha Fernando.
http://archives.sundayobserver.lk/2009/10/25/sec03.asp
[13] http://archives.dailynews.lk/2009/08/17/news28.asp
[14] https://alt.army.lk/lightinfantry/10slli
http://archives.sundayobserver.lk/2009/11/08/sec03.asp
[15] http://archives.sundayobserver.lk/2009/08/09/fea05.asp
[16] https://alt.army.lk/lightinfantry/former-centre-commandants
[17] https://www.army.lk/news/army-distributes-accessories-uniforms-school-students
[18] http://www.defence.lk/Article/view_article/488
[19] https://www.facebook.com/permalink.php?id=473504946332403&story_fbid=1160407764308781
[20] The delegation of Sri Lanka to the MSP included Deputy Permanent Representative Dayani Mendis, Military Liaison Officer of the Ministry of Defence Brigadier Jagath Kodithuwakku and officers of the Permanent Mission of Sri Lanka to the UN in Geneva.
For more on cluster munition victims see https://itjpsl.com/reports/cluster-munitions
[21] Army Biography at https://alt.army.lk/sfhqeast/goc-22div-profile
https://www.linkedin.com/in/channa-weerasuriya-6a99b089/
[22] https://alt.army.lk/lightinfantry/4slli
[23] http://defencereal.blogspot.com/2009/01/

2009 යුද්ධයෙන් පසු 2009 දී උසස් කරන ලදී [24] 2013 දී බ්‍රිගේඩියර්[25].
2020 අප්‍රේල්: 22 සේනාංකයේ ආඥාපති[26].
ඔහුගේ නිල චරිතාපදානයට අනුව 2008 සිට "බලසේනා ආඥාපතිවරයකු ලෙස ඔහු 512[27], 523, 663 පාබල සේනාංක වලටත්, ගුවන් සංක්‍රමණික බළ සේනාවටත්[28] අණ දුන්නේය. [512, 513[29] සහ 515 බලසේනා මුලස්ථානය පැවතියේ යාපනය ආරක්ෂක සේනා මුලස්ථානයේ 51 සේනාංකය යටතේය.]
2011 නොවැම්බර් 3 මාධ්‍ය වාර්තාවක යාපනයේ ශිෂ්‍යත්ව ප්‍රදානයක යෙදුනු චන්න වීරසූරිය හැඳින්වෙන්නේ 512 බලසේනා ආඥාපති[30] ලෙසය.
යාපනයේ 512 කඳවුර වධබන්ධන සම්බන්ධයෙන් කුප්‍රසිද්ධියක් උසුලන්නකි. ITJP සාක්ෂිකාර W15 එහිදී 2010 ආරම්භයේ දී ද 2011 දී 512 කඳවුරේ අත්සන් කර ටික වෙලාවකින් ද වධහිංසාවට ගොදුරු වී තිබේ.
2014 අගෝස්තු 8: ආඥාපති 542 බලසේනාව [31]."
2013-15 පනාගොඩ ශ්‍රීලංපාහ මධ්‍යස්ථාන සේනා විධායක[32].
2018 නොවැම්බර්: ඔහු විසින් "කිලිනොච්චි ප්‍රතිසංධාන ක්‍රියාවලිය සහ නැවත පදිංචි කිරීම" පිළිබඳව විදේශ ශිෂ්‍ය නිලධාරීන් කිලිනොච්චියේ අධ්‍යයන සංචාරයකට කැඳවාගෙන යන ලදී[33]. ඔහු ශ්‍රී ලංකා පාබල හමුදාවේ රෙජිමේන්තු මධ්‍යස්ථානයේ මධ්‍යස්ථාන සේනා විධායකයාය[34].
2018: කිලිනොච්චි ආරක්ෂක සේනා මුලස්ථානයේ බ්‍රිගේඩියර් ප්‍රධාන මාණ්ඩලික නිලධාරියාය[35]
2020 අප්‍රේල් 22 ප්‍රධාන අණදෙන නිලධාරී: 22 පාබල සේනාංකය[36].

## 5. මේජර් ජෙනරාල් චන්දන[37] උදිත්[38] මාරසිංහ

සේවා අංකය: නි/ 60753, ශ්‍රී ලංකා යුද්ධ හමුදා යුධොපකරණ බළකාය,
2008 ජනවාරි 7 – 2009 නොවැම්බර් 2 ශ්‍රී ලංකා යුද්ධ හමුදා යුධොපකරණ බළකායේ අණදෙන නිලධාරී[39], SLAOC[40]. එම බලකායේ වෙබ් අඩවියේ දැක්වෙන පරිදි "3 වැනි යුධොපකරණ බළකායට දිවයිනේ නැගෙනහිර කලාපයට යුද්ධෝපකරණ සැපයීමේ කාර්යභාරය පවරන ලදී." [41] 3SLAOC වැලිකන්දේ ස්ථාපිත කර තිබූ බව පෙනී යයි[42].
2010 ජූනි: හයිටි එක්සත් ජාතීන්ගේ සාමසාධනයේ හටකාර්ය සම්පාදන නිලධාරී[43]
2014: තාවකාලික බ්‍රිගේඩියර් නිලයට උසස් කිරීම[44].
2019: අධ්‍යක්ෂ: ශ්‍රී ලංකා යුද්ධ හමුදා යුධොපකරණ බළකාය

---

[24] http://archives.dailynews.lk/2009/08/17/news28.asp
[25] http://220.247.247.85:8081/bitstream/handle/123456789/21908/2016-10-28%28I-I%29E.pdf?sequence=3&isAllowed=y
[26] https://www.facebook.com/SriLankaArmyDefendersoftheNation/posts/1161177397565151 https://alt.army.lk/sfhqeast/22division
[27] http://cimicjaffna.lk/profile-of-sfhq-j
[28] https://alt.army.lk/sfhqeast/goc-22div-profile
[29] 513 Camp in Jaffna is a site notorious for torture: See ITJP report, Page 56, footnote 1 https://www.tamilrefugeecouncil.org.au/wp-content/uploads/files/stoptorture_report_v4_online.pdf regarding an army camp used for torture in Chavakachcheri.
*Uduvil Army Camp:* 513 Brigade was stationed here in 2013 according to their Facebook page[29].
This is an army camp in the Jaffna Peninsula known for torture – W96 had to report to Uduvil camp from 2010-13 and on nine separate occasions was tortured there and then finally abducted in 2013 and detained by military intelligence for 8 days and tortured and sexually violated.
[30] https://www.onlanka.com/news/512-brigade-of-sl-army-offers-scholarships-to-ten-more-students-in-jaffna.html
[31] http://documents.gov.lk/files/gz/2016/10/2016-10-28(I-I)E.pdf
[32] https://alt.army.lk/lightinfantry/former-centre-commandants?
[33] https://alt.army.lk/sfkilinochchi/si/content/විදේශ-ශිෂ්%E2%80%8Dය-නිලධාරින්-ආරක්%E2%80%8Dෂක-සේනා-මුලස්ථානය-කිලිනොච්චි-සංචාරය
[34] https://alt.army.lk/lightinfantry/content/colonel-cd-weerasuriya-appoints-new-center-commandant-slli
[35] https://www.army.lk/news/slma-cadets-under-training-tour-kilinochchi-jaffna
[36] https://www.facebook.com/SriLankaArmyDefendersoftheNation/posts/1161177397565151
https://alt.army.lk/sfhqeast/22division
[37] https://ciltsl.com/wp-content/uploads/2019/06/May-Newsletter.pdf p26
[38] https://www.ismmsrilanka.com/img/ISMMeNewsletter-December2017.pdf
[39] https://alt.army.lk/slaoc/si/si-3-slaoc
[40] https://alt.army.lk/slaoc/3-slaoc
[41] https://alt.army.lk/slaoc/3-slaoc
[42] "Accounting work done by the Forward Ordnance Depot (Ampara) ceased temporarily on 23 August 2006. Due to operational requirement, Forward Ordnance Depot (Batticaloa) was established at the paper factory (Valachchanei)." https://alt.army.lk/slaoc/3-slaoc
[43] SLAOC.
https://panjiva.com/Sri-Lanka-Contigent/5364820
[44] http://documents.gov.lk/files/gz/2018/11/2018-11-30(I-I)E.pdf

INTERNATIONAL
TRUTH
AND JUSTICE
PROJECT